# <u>අළුහම් (Pityriasis versicolor)</u>

අළුහම් රෝගය යනු සමාජයේ බහුලව දක්නට ලැබෙන සමේ ඇතිවන්නා වූ දිලීර ආසාදන තත්ත්වයකි. එය ඇති කරනු ලබන්නේ *Malassezia furfur* නැමති දිලීරයයි.

## (1) රෝගය ඇතිවන්නේ කෙසේද?

සාමාන්‍යයෙන් මිනිස් සම ආශ්‍රිතව හානිකර නොවන දිලීර සහ බැක්ටීරියා වාසය කරයි. *Malassezia furfur* යන දිලීරයද එම කාණ්ඩයට අයත්ය. නමුත් සමහර තත්ත්ව යටතේ (උදා:-අධික උණුසුම, තෙතමනය, ප්‍රතිශක්තිකරණ ඌනතා) මෙම දිලීරය සම මත අධික ලෙස වර්ධනය වීමෙන් අළුහම් රෝගය ඇතිවේ. මෙය ජාන ගත රෝගයක් හෝ බෝවන රෝගයක් නොවේ.

## (2) රෝග ලක්ෂණ මොනවාද?

- සුදට හුරු ලා පැහැති හෝ තද දුඹුරු පැහැති පැල්ලමක් හෝ පැල්ලම් කිහිපයක් ලෙස සම මතුපිට අළුහම් රෝගය දැකිය හැකියි.
- මෙම පැල්ලමක් තදින් ඇතිල්ලූ විට හෝ සූරා බැලූ විට සුදු පැහැති සියුම් පොතු පැල්ලම් මත දැක ගත හැකියි.
- රෝගියා හට අදාල පැල්ලම් ඇති තැන්වල සුලු කැසීම් තත්වයක් ඇතිවිය හැකිය.
- ශරීරයේ ඕනෑම ප්‍රදේශයක මෙය වැලඳුනත් විශේෂයෙන් බෙල්ල, පපුව හෝ පිටපැත්තේ මෙම පැල්ලම් දැකිය හැකිය.
- වයස් භේදයකින් තොරව මෙසේ ඕනෑම කෙනෙකුට වැළඳිය හැකිවුවත් තරුණ වයසේ පුද්ගලයන්ගේ මෙම තත්ත්වය වැඩිපුරම දැකිය හැක.

## (3) අළුහම් හඳුනා ගන්නේ කෙසේද?

චර්ම රෝග වෛද්‍යවරයෙකුට පැල්ලම් පරීක්ෂා කර බැලීමෙන් මෙම රෝගය හඳුනාගත හැකියි. ඉතා විරල අවස්ථාවකදී විශේෂ පරීක්ෂණ වලට භාජනය කළ හැක.

## (4) ප්‍රතිකාර ක්‍රම මොනවාද?

බොහෝ දෙනෙකුට හුදෙක් සම මතුපිට ගල්වන ආලේපන ප්‍රතිකාර පමණක් සෑහේ.

උදා:- ප්‍රති දිලීර ඖෂධ සහිත ක්‍රීම් වර්ග සහ ෂැම්පූ වර්ග (eg:- ketoconazole cream/ shampoo)

තවදුරටත් අවශ්‍ය යයි වෛද්‍යවරයාට හැඟී ගියහොත් පමණක් බෙහෙත් පෙති හෝ කරල් නිර්දේශ කරනු ඇත.

## (5) අළුහම් රෝගය සුවකළ හැකිද?

නිසි ප්‍රතිකාර ක්‍රම භාවිතා කිරිම මගින් මෙම රෝගය නිට්ටාවට සුව කළ හැකිය.

## (6) ප්‍රතිකාර වලින් පසු ඔබ දැනගතයුතු දෑ මොනවාද?

- නිවැරදිව ප්‍රතිකාර සිදු කළද, සමෙහි ලා පැහැති ස්වභාවය මාස කිහිපයක් පැවතිය හැකිය.
- සම්පූර්ණයෙන් සුව වූ පසුව වුවද නැවත අළුහම් රෝගය වැළදිය හැකිය.